හෝමාගම ප්‍රාදේශීය සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

හෝමාගම ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට හෝමාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වත්කම්වලට අදාළව ක්ෂය අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ මුළු ක්ෂය වියදම රු. 404,010 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	නිවැරදි කර ඇති අතර ස්ථාවර වත්කම් ලේඛනවල ද ඇතුලත් කර ඇති බව.	වාර්ෂික ක්ෂය නිවැරදිව ගණනය කළ යුතුය.
(ආ)	ඉදිරි වර්ෂය වෙනුවෙන් ලද වරිපනම් බදුවලට අදාළ දුන් වට්ටම් ශේෂය රු. 2,627,240 ක් මූල්‍ය ප්‍රකාශවල දක්වා නොතිබුණි.	දුන් වට්ටම් ප්‍රවර්තන වර්ෂයේ වියදමක් නොවන බැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොමැති බව.	දුන් වට්ටම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ව්‍යාපෘති 18 ක් වෙනුවෙන් වැය කරන ලද එකතුව රු. 40,105,238 ක වියදම් පුනරාවර්තන වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි.	2024 වර්ෂයේ පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත වී ඇති බව.	වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ව්‍යාපෘති 13 ක් වෙනුවෙන් ලැබී තිබූ විමධ්‍යගත සහ පළාත් සභා ආධාර එකතුව රු. 23,870,047 ක් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් කළ මාරුකිරීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2024 වර්ෂයේ පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත වී ඇති බව.	ප්‍රදාන ලැබීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඉ)	භෞතිකව නොතිබුණු රු. 4,228,544 ක තොග ශේෂයක් රු. 13,546,185 ක් වූ සාමාන්‍ය ගබඩා භාණ්ඩ තොග ශේෂයෙහි ඇතුළත්ව තිබුණු හෙයින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු. 4,228,544 කින් තොග ශේෂය වැඩියෙන් දැක්වේ.	සමීක්ෂණ වාර්තාවේ භෞතික ශේෂය අඩුවෙන් පෙන්නුම් කර ඇති බව.	භෞතිකව නොතිබුණු ශේෂය පිළිබඳව පරීක්ෂා කර තොග වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.

1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශනවල ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂය රු. 95,798,821 ක් වුවද, ලේජරයේ ශේෂය රු. 92,437,771 ක් වූයෙන් රු. 3,368,050 ක වෙනසක් විය.	ආපසු ගෙවිය යුතු තැන්පත් පරීක්ෂා කරමින් පවතින බව.	වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	මූල්‍ය ප්‍රකාශනවල සේවකයන්ගෙන් ලැබිය යුතු දෑ ලෙස රු. 34,596,677 ක ශේෂයක් දක්වා තිබුණද ලේජරයේ ශේෂය රු. 34,589,677 ක් වූයෙන් රු. 7,000 ක වෙනසක් විය.	සේවක ණය උපලේඛනය අනුව ශේෂය රු. 34,596,677 ක් වන බව.	වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.6.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය වෙනුවෙන් සාවද්‍ය ලෙස බිල්කර තිබුණු රු. 6,000,000 ක කුලී මුදල හා රු. 183,000,000 ක දඩ මුදල වශයෙන් මුළු මුදල රු. 189,000,000 ක් ගිවිසුම් නිවැරදි කිරීමකින් හා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව පාලන කමිටු අනුමැතිය පමණක් ලබාගෙන වර්ෂයේ ආදායමෙන් කපාහැර තිබුණි.	කුලී තක්සේරුව සඳහා බදු ගැනුම්කරු එකඟ නොවුනු බැවින් මෙම බිල් කිරීම ලේඛන සංශෝධනයක් මඟින් නිවැරදි කර ගන්නා ලද බව.	නිසි අනුමැතිය ලබාගෙන ගිණුම්වලින් ඉවත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත 127 වගන්තිය ප්‍රකාර සුසාන භූමි හා මිනී පිටි ආඥා පනතේ 3 වගන්තිය හා 128 වගන්තිය	සභා බලප්‍රදේශය තුළ පිහිටා ඇති සුසාන භූමි 38 ක සීමා නිර්ණයන් තීරණය කොට සභාවට පවරා ගෙන ගැසට් කිරීමට පියවර ගෙන නොතිබුණි.	රජයේ ඉඩම් ලෙස ගැසට් වී ඇති සියළු සුසාන භූමි පවරා ගැනිමට ලිපි යොමු කර ඇති බව.	පවරා ගැනිම් කටයුතු කඩිනම් කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571	2014 වර්ෂයේ සිට පවතින රු. 44,147,784 ක පොදු කර්මාන්ත තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පසුගිය කාලසීමාවට අදාළ තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කරන බව.	ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016	සභාව සතු වාහන 38 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි.	ඉදිරියේදී එම රථවල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුය.
(ඈ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:3:1 (අ)	ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍ය ආයතනය මඟින් අනුමත කරන ලද සම්මත ලංසු කැඳවීමේ ලේඛනවල යෝග්‍ය ආදර්ශයක් අවශ්‍ය නම් කොන්ත්‍රාත්වල පැනනගින නිශ්චිත කරුණු කෙරෙහි ආමන්ත්‍රණයක් කළ හැකි පරිදි අවම වෙනස්කම් සහිතව භාවිතා කළ යුතු වුවත් ජල්තර ආදාහනාගාරය ඉදිකිරිම සම්බන්ධයෙන් රු. 6,823,834 ක වියදම් වෙනුවෙන් එවැනි සම්මත ලේඛන භාවිතයට ගෙන නොතිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති පරිදි සම්මත ලේඛණ භාවිතා කරමින් ප්‍රසම්පාදන කටයුතු සිදුකරන බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු. 336,681,651 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු. 373,112,282 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	2024 දෙසැ.31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කළ ආදායම	රැස්කළ ආදායම	2023 දෙසැ.31 දිනට මුළු හිඟය
	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
(i)වරිපනම් හා බදු	219,170	224,589	204,404	154,555	228,802	178,254	176,900	123,024
(ii) කුලී	20,105	18,237	17,940	2,400	18,969	19,435	18,522	(9)
(iii)බලපත්‍ර ගාස්තු	7,063	4,483	4,231	277	5,791	4,746	4,838	25
(iv)වෙනත් ආදායම්	637,569	659,072	930,399	573,928	632,929	843,660	973,413	620,966
එකතුව	883,907	906,381	1,156,974	731,160	886,491	1,046,095	1,173,673	744,006

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු වරිපනම් රු. 154,456,203 ක් අයකරගෙන නොතිබුණි.	හිඟය අවම කර ගැනීමට කටයුතු යොදමින් පවතින බව.	හිඟ වරිපනම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ මුදල කොපමණද යන්න ගණනය කර ගිණුම්ගත කර නොතිබුණු අතර ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය රු. 478,232,148 ක් විය.	ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 478,232,148 ක මුදල ඇස්තමේන්තුවක් පමණක් වන අතර, වර්ෂයක් අවසානයේ දී එම මුද්දර උපලේඛන සකස් කිරීමෙන් පසු සත්‍ය බිල් කිරීම සොයා ගත හැකි බව.	ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේදී සභා භූමිය තුළ විදුලි පද්ධතියක් සවිකිරීම සඳහා රු. 2,242,000 ක මුදලකට ට්‍රාන්ස්පෝමරයක් සවිකිරීමට 2024 නොවැම්බර් 25 දින පුද්ගලික ආයතනයක් වෙත ටෙන්ඩරය පිරිනමා තිබුණි. මාස දෙකක කාලයක් තුළ මෙම ව්‍යාපෘතිය නිම කළ යුතුව පැවතියද, 2025 අප්‍රේල් 25 දින වනවිටත් එය නිමකර නොතිබුණි. තවද මාස 02 ක් සඳහා වූ රු. 112,100 ක කාර්යසාධන ඇපකරය ද දීර්ඝ කරවාගෙන නොතිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් විදුලිබල මණ්ඩලය විසින් සපයා තිබුණු රැහැන් සහ අනෙකුත් උපාංග අස්ථානගත වීමේ අවදානමක් පැවතුණි.	ව්‍යාපෘතියේ කටයුතු ඉක්මනින් නිම කරන ලෙසත්, කාර්යසාධන ඇපකරයේ කාලය ඉකුත් වී ඇති බැවින් එහි කාලය දීර්ඝ කරන ලෙසත් දන්වා ලිපියක් යොමුකර ඇති බව.	කඩිනමින් ව්‍යාපෘතියේ වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට මිශ්‍ර ණයහිමි, ගබඩා ණයහිමි, පොදු කර්මාන්ත ණයහිමි හා පළාත් සභා ණයහිමි යන ශේෂයන්හි එකතුව රු. 114,762,400 ක් වූ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව.	ණයහිමි ශේෂයන් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2024 ජනවාරි 01 දිනට පැවති පොදු අත්තිකාරම් රු. 6,136,853 ක ශේෂය වර්ෂය තුළ නිරවුල් කර නොතිබුණි. ඉන් එකතුව රු. 6,099,044 ක් සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු සභාව සතුව නොතිබුණි.	අවසන් ගිණුමෙහි 2024 වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් හි 12 යටතේ කරුණු දක්වා ඇත.	නිශ්චිත තොරතුරු නොමැති ශේෂයන් කඩිනමින් හඳුනාගෙන අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 වර්ෂයෙන් පසු වැතර උප කාර්යාල බල ප්‍රදේශයේ වරිපනම් තක්සේරුවක් සිදුකර නොතිබීමෙන් 2024 වර්ෂයේ වරිපනම් ආදායම අඩුවී තිබුණි.	2023 පෙබරවාරි 23 දිනැතිව තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් සිදුකර ඇති බව.	නව තක්සේරුවක් සිදුකර වරිපනම් ආදායම වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂය තුළ සභාව සතු ඉඩම්වල වටිනාකම රු. 1,619,617,792 කට ප්‍රත්‍යාගණනය කර තිබුණද, එම කටයුතු සුදුසුකම්ලත් ස්වාධීන තක්සේරුකරුවෙකු විසින් සිදුකර නොතිබුණි.	ප්‍රාදේශීය සභාව මඟින් පත් කරන ලද වත්කම් කළමනාකරණ කමිටුව මඟින් ප්‍රත්‍යාගණනය සිදු කරන ලද බව.	සුදුසුකම්ලත් ස්වාධීන තක්සේරුකරුවෙකු විසින් ඉඩම් තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය පිහිටි භූමිය 2003 වර්ෂයේ සිට වර්ෂ 33 ක් සඳහා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය වෙත බදු ගිවිසුමක් මඟින් බදුදී තිබුණි. මෙම දේපළ සභාව සතු දේපළක් බවට ප්‍රකාශ කර තිබුණද එහි නීත්‍යානුකූල අයිතිය 2025 මාර්තු වන විටද සභාවට පවරාගෙන නොතිබුණි.	මීගොඩ විශේෂ ආර්ථික මධ්‍යස්ථාන පිහිටි ඉඩමේ හිමිකම් සහතිකය ලබා ගැනීම සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවට ලිපි යොමු කර ඇති බව.	මෙම දේපලෙහි නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාව වෙත අයිතිය පවරාගෙන නොමැති ක්‍රීඩාංගන 41 ක් පැවතුණි.	ඇතැම් ක්‍රීඩාපිටි පොදු පහසුකම් ඉඩම්වල ඇති ක්‍රීඩාපිටි බව.	මෙම ක්‍රීඩාපිටිවල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2008 අප්‍රේල් 09 දින හෝමාගම ප්‍රාදේශීය සභාවට භාරදී තිබුණු ට්‍රැක්ටරයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව.	කඩිනමින් පවරා ගැනීම් කටයුතු කළ යුතුය.
(ඈ)	හෝමාගම ප්‍රාදේශීය සභාව සතු ඉඩම් 09 ක සහ මාර්ග ඉන්වෙන්ට්‍රිය ප්‍රකාරව පැවති මාර්ග 620 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් 11 ක් සඳහා ඔප්පු සකස් කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව හා මාර්ග මැනුම් කටයුතු හා ගැසට් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව.	කඩිනමින් පවරාගැනීම් කටයුතු සිදු කළ යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තෙවන අවම මිල ඉදිරිපත් කර තිබුණු ආයතනයේ තත්ත්ව සහතිකය සහ අවුරුදු 03 ක වගකීම් කාලයක් සහිතව රු. 1768 ක් වැනි අඩු මිලකට බල්බ මිලදී ගැනීමට හැකියාව තිබියදී මිල කැඳවීම් නොකළ ආයතනයකින් බල්බ 9000 ක් රු. 17,226,000 කට මිලදී ගැනීම නිසා සභාවට රු. 1,432,000 ක පාඩුවක් සිදුව තිබුණි.	2024 ජනවාරි 01 දින සිට බිල්පත් කරනු ලබන සියලු LED බල්බවල මිල සියයට 18 කින් වැඩි වීම, ආයතන සියල්ලෙහි ම මිල ගණන් සියයට 18 කින් ඉහළ යාම කෙරෙහි බලපාන පොදු සාධකයක් බැවින්, එම	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.

	ආයතනයෙන් මිලදී ගැනීමට අනුමැතිය ලබා දීමට තීරණය කළ බව.	
(ආ) Aluminum Binding Wire 1kg ක් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ සහ වසර 05 ක වගකීම් කාලයක් ලබාදී තිබුණු ආයතනය සාම්පල් ඉදිරිපත් නොකිරීම මත ප්‍රතික්ෂේප කර තිබුණද සාම්පල් ලබා ගැනීමට සභාව උත්සහයක් දරා නොතිබුණි. පසුව වැඩි මිලට වයර් කිලෝ ග්‍රෑම් 170 ක් මිලදී ගැනීම නිසා සභාවට රු. 357,000 ක පාඩුවක් සිදුවී තිබුණි.	මිල ගණන් හා සාම්පල ඉදිරිපත් කරන ලද අනෙක් ආයතනයෙහි මිල ගණන් නිර්දේශ කරන ලද බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ජල්තර ආදාහනාගාරය ඉදිකිරීම සඳහා 2019 වර්ෂයේදී කොන්ත්‍රාත් පිරිනමා තිබුණද, ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය ලැබී නොතිබුණි. පළමු අදියර යටතේ රු. 4,000,000 ක මුදලකට ගිවිසුම්ගත වී තිබුණු අතර, වැඩ අවසන්වී රු. 3,460,271 ක් ගෙවීම් කර තිබුණි. දෙවන අදියර යටතේ 2020 දෙසැම්බර් 28 දින රු. 16,817,777 ක මුදලකට මාස 06 ක් ඇතුළත වැඩ අවසන් කිරීමට ගිවිසුම් ගත වී ඒ වෙනුවෙන් රු. 3,363,555 ක අත්තිකාරම් මුදලක් ද ගෙවා තිබුණි. එහෙත් එම අත්තිකාරම් මුදල ආවරණය වන ප්‍රමාණයට හෝ වැඩ ඉටු නොකර කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතුවලින් ඉවත් වී තිබුණු අතර කාර්යසාධන සුරක්ෂණය ද 2024 මැයි 10 දින කල්ඉකුත් වී තිබුණි. මේ හේතුවෙන් අඩක් නිමවූ ආදාහනාගාරය අව් වැසිවලට හසුවෙමින් වල් බිහිවී සමාජ විරෝධී ක්‍රියා සඳහා යොදාගෙන තිබුණු බවට අනාවරණය විය.	දැනට ඉටුකර ඇති වැඩ ප්‍රමාණයට අනුව ගෙවීම් වාර්තා සකස් කර අත්තිකාරම් මුදල පියවා ගැනීමට කටයුතු කරන බව.	කඩිනමින් ඉදිකිරීම් නිම කිරීමට කටයුතු කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මිය ගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය, වැඩ තහනම් කරන ලද හා ස්ථාන මාරුවීම් ලද 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,095,068 ක් වූ ආපදා හා උත්සව ණය මුදල් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය අයකර ගැනීමට ක්‍රියාමාර්ගය ගනිමින් පවතින බව.	සේවක ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.7 වාහන පද්ධතිය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව සතු වැතර උපකාර්යාලයට අනුයුක්ත වාහන හා යන්ත්‍ර 61 කට අදාළව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා සිදු කරන ලද වාහන සමීක්ෂණයේදී ට්‍රැක්ටර් රථ 03 ක්, ටේලර් 04 ක්, මාර්ග තලන යන්ත්‍රයක් හා මෝටර් ග්‍රේඩරයක් අලුත්වැඩියා කොට නැවත භාවිතයට ගැනීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය එපරිදි කටයුතු කර නොතිබුණි.	සභාව සතු වාහන අපහරණය කිරීම සඳහා කොළඹ මහ නගර සභාවේ යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ සහය මත කටයුතු සිදුකරමින් පවතින බව.	අපහරණය කිරීම් හෝ අලුත්වැඩියාවන් සිදුකර ධාවනයට ගැනීම කඩිනමින් සිදු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අයවැය පාලනය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැය විෂයයන් 66 ක් සඳහා සලසා තිබූ එකතුව රු. 16,558,500 ක් වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.	පිළිගන්නා බව	අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය.
(ආ)	වැය විෂයයන් 39 ක් වෙනුවෙන් රු. 27,080,200 ක් වෙන්කර තිබුණද එයින් සියයට 75 කට වඩා වැඩි ප්‍රමාණයක් වැය කර නොතිබුණු අතර එම ප්‍රමාණය රු. 23,216,852 ක් විය.	පිළිගන්නා බව	අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය.

4.2 පාරිසරික ගැටලු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාව විසින් දිරන සහ නොදිරන කසළ අදාළ කසළ අංගන වෙත බැහැර කිරීම සඳහා වර්ෂයකට රුපියල් මිලියන 51 ක් පමණ වැය කරන අතර 2024 දෙසැම්බර් මාසය තුළ දින කිහිපයක් නොදිරන කසළ ප්‍රවාහනය ඇණහිටීම හේතුවෙන් රු. 1,260,000 ක අමතර වියදමක් දරමින් කසළ ඩෝසර් කිරීම සිදුකර තිබුණි. එහෙත් දිරාපත්වන කසළ වෙනත් අංගනයක් වෙත ප්‍රවාහනය නොකර කොම්පෝස්ට් නිෂ්පාදනය කර එම පොහොර විකිණීමෙන් අමතර ආදායමක් ලබාගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.	සභා බල ප්‍රදේශය තුළ කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීම සඳහා සුදුසු ඉඩමක් නොතිබුණු බැවින් හෝමාගම ගබඩාවත්තේ පවත්වාගෙන යන ලද කොම්පෝස්ට් අංගනය වෙත කොම්පෝස්ට් ජනනය කළ හැකි කසළ නොමිලේ ලබාදෙමින් දිරන කසළ ප්‍රවාහනය සඳහා දරනු ලබන වියදම් අවම කර ගැනීමට කටයුතු කළද ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවය මත එය මේ වනවිට නවතා දමා ඇති	දිරන කසළ ප්‍රතිචක්‍රියකරණය සිදුකර ආදායමක් උපයා ගැනීමට කටයුතු කළ යුතුය.

බැවින් නැවතත් කරදියාන කසලාංගනය වෙත දිරන කසළ ලබාදීම හා එක් ප්‍රදේශයක්, මාර්ගයක් තෝරාගෙන එම ප්‍රදේශයට, කොම්පෝස්ට් බඳුන් සහන පදනම මත ලබා දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන බව.